# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1368/13 - 2004 නොවැම්බර් 23 වැනි අඟහරුවාදා - 2004.11.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27 (1) වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 21 සහ 139 වැනි වගන්ති සමග සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු එකී විශ්ව විද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් සාදන ලද 1986 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 420/25 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි :-

(1) (V) වන ඡේදයේ 1 වන තීරයේ ඇති විද්‍යා පීඨයට එරෙහිව 2 වන තීරයේ ඇති ''භූගෝල විද්‍යා අධ්‍යයන අංශය'' යන වචන ඉවත් කොට එම වචන 2 වන තීරයෙහි ''ලලිත කලා අධ්‍යයන අංශය'' යන වචන වලට පසුව එකතු කිරීමෙන් ;

(2) (අ) (V) වන ඡේදයේ 1 වන තීරයේ ''සංස්කෘතික අධ්‍යයන පීඨය'' යන වචන වෙනුවට ''කලා සහ සංස්කෘතික කටයුතු පීඨය'' යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (V) වන ඡේදයේ 2 වන තීරයෙහි ''භූගෝල විද්‍යා අධ්‍යයන අංශය'' යන වචන වලට ඉක්බිතිව පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

''භාෂා අධ්‍යයන අංශය

සමාජ විද්‍යා අධ්‍යයන අංශය''

---

1A-G 005069 - 1040 (2004/11)

(3) පිළිවෙලින් 1 වන සහ 2 වන තීරවල අවසානයට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

| | |
|---|---|
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය | මානව ජීව විද්‍යා අධ්‍යයන අංශය (කාය විච්ඡේදන විද්‍යාව,<br>කායික විද්‍යාව සහ ජීව රසායන විද්‍යාව) ව්‍යාදි කායික විද්‍යා අධ්‍යයන අංශය, (ව්‍යාදිවේදය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පරපෝෂ විද්‍යාව සහ අධිකරණ වෛද්‍ය විද්‍යාව)<br>සායන විද්‍යා අධ්‍යයන අංශය (වෛද්‍ය විද්‍යාව, ශෛල්‍ය වෛද්‍ය විද්‍යාව,<br>ධාත්‍රික හෞතවේදය සහ නාරි වේදය, ළමා රෝග විද්‍යාව,<br>මානසික විද්‍යාව, හීෂග්වේදය සහ ඡායා සටහන් කිරීම.<br>ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ අධ්‍යයන අංශය (ප්‍රජා සෞඛ්‍ය සහ පවුල් සෞඛ්‍ය)<br>වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණ පිළිබඳ අධ්‍යයන අංශය<br>පරිපූරක සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය (හෙද සේවය, හෛසජ්ජන,<br>වෛද්‍ය රසායනාගාර තාක්ෂණය, විකිරණ විද්‍යාව සහ හෞතික චිකිත්සාව) |

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2004 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

12-271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.